# 8

# සුබෝධාලංකාරයෙහි නිර්දිෂ්ට අලංකාර කීපයක් පිළිබඳ විමසුමක්

ගෞරව ශාස්ත්‍රවේදී, රාජකීය පණ්ඩිත පූජ්‍ය පහලගම ධම්මික හිමි

සෞන්දර්ය රසාස්වාදනයෙහිලා කාව්‍ය රසය ප්‍රධාන වෙයි. එය ශ්‍රැති ගෝචර වූ නිසා කාව්‍ය රසයෙහිලා බොහෝ දෙනෙකු ආශක්තව ක්‍රියා කරති. රසයෙන් යුක්ත කාව්‍ය නිර්මාණය වන්නේ කාව්‍යාලංකාර තුළින් නිපන් කාව්‍යයයි. හුදෙක් පද වැලක් කාව්‍ය නොවේ. ඒ සඳහා විධිමත් ආකාරයෙන් අලංකාර මුසු විය යුතුයි. කාව්‍ය බන්ධනයෙහිලා ඡන්දස් ශාස්ත්‍රය ප්‍රමුඛ වන්නා සේම අලංකාර ශාස්ත්‍රයත් ඊට නොදෙවෙනිව ක්‍රියාත්මක වෙයි.

ක්‍රිඃපූඃ පළමු සියවසේ ජීවත් වූ භරතමුනිහු සිය නාට්‍ය ශාස්ත්‍රය නැමැති දෘශ්‍ය කාව්‍යෝපදේශකථනය තුළින් කාව්‍යාලංකාර ශාස්ත්‍රයට මූල බීජ සැපයූ බව බොහෝ දෙනෙකුගේ අදහස වෙති. ක්‍රිඃවඃ පස්වන සියවසේ ජීවත් වූ භාමහ විසින් රචිත කාව්‍යාලංකාර නම් කෘතිය මෙම ශාස්ත්‍රය ඉදිරියට පැවැතීම උදෙසා බොහෝ සෙයින් ආධාර වූ බව පෙනෙයි. එසේ ම ක්‍රිඃ වඃ හත් වන සියවසේ ජීවත් වූ දණ්ඩී නම් ආචාර්යවරයා විසින් කාව්‍ය ගද්‍ය හා පද්‍ය වශයෙන් කොටස් දෙකකට බෙදෙයි. පාලි සාහිත්‍යය වනාහි කාව්‍යාත්මක ගුණයෙන් යුත්ත වෙයි. කාව්‍ය පිළිබඳ දණ්ඩී නම් ආචාර්යවරයා විසින් රචිත කාව්‍යාදර්ශය ද ක්‍රිඃවඃ අට වැනි සියවසේ ජීවත් වූ වාමන ආචාරීන්ගේ කව්‍යාලංකාර සූත්‍ර වෘත්ති නම් කෘතිය ද ආනන්ද වර්ධන නම් ආලංකාරිකයා විසින්

රචිත ධ්වන්‍යාලෝකය නම් කෘතිය ද ක්‍රි: ව: දස වන සියවසේ ජීවත් වූ රාජශේඛරයන්ගේ කාව්‍යමීමංසා නම් කෘතිය ද ක්‍රි: ව: එකොළොස් වන සියවසේ ජීවත් වූ කුන්තකගේ වක්‍රෝත්ති ජීවිතය නම් කෘතිය ද ක්‍රි: ව: දාහතර වන සියවසේ ජීවත් වූ විශ්වනාථයන්ගේ සාහිත්‍යදර්පණය ද කාව්‍යාලංකාර ශාස්ත්‍රය විකාශනය සඳහා මාර්ගෝපදේශක කෘති වශයෙන් ප්‍රමුඛ වී තිබේ.

සංස්කෘත අලංකාර ශාස්ත්‍රය සඳහා ගුරූපදේශ කථනයෙහිලා කාව්‍යාලංකාර කෘති ගණනාවක් දක්නට ලැබේ. ඒ අතර අතිශය ජනප්‍රියත්වයට පත් වී ඇත්තේ දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයයි. පාලි කාව්‍යලංකාරකරණයට උපදෙස් සපයන කෘතියක් බිහිවන්නේ පොළොන්නරු යුගයේ දීය. ඒ සංඝරක්‍ෂිත හිමියන්ගේ සුබෝධාලංකාරයි.[1] මෙම කෘතියෙහි ගාථා 367ක් හා පරිච්ඡේද පහකින් සමන්විත වෙයි. සුබෝධාලංකාර පරිච්ඡේද වර්ග කොට ඇත්තේ මෙසේය.

01. දෝසාවබෝධ පරිච්ඡේදය

02. දෝසපරිහාර පරිච්ඡේදය

03. ගුණවබෝධ පරිච්ඡේදය

04. අර්ථාලංකාර පරිච්ඡේදය

05. රසවබෝධ පරිච්ඡේදය

පළමු පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ කාව්‍ය දෝෂ පිළිබඳ ඉගැන්වීම සඳහාය. කාව්‍ය දෝෂ පරිහාර පිළිබඳ දෙවන පරිච්ඡේදය වෙන් කොට තිබේ. කාව්‍ය ගුණ තෙවන පරිච්ඡේදයෙන් උගන්වනු ලබයි. හතර වන පරිච්ඡේදය තුළින් උගන්වන්නේ කාව්‍යාලංකාරයන්ය. පස්වන පරිච්ඡේදය රස, භාව හා ව්‍යභචාරී භාව පිළිබඳ උගන්වයි.

කාව්‍යාදර්ශයේ දී ''කාව්‍යශෝභාකරාන් ධර්මාන් නලංකාරන් ප්‍රචක්‍ෂතෙ''[2] යනුවෙන් ප්‍රකාශ කරන්නේ කාව්‍ය ශෝභාව ඇති කරන්නේ කාව්‍යාලංකාර වලින් බවයි. සාහිත්‍යදර්පණයේ දී ''වාක්‍යං රසාත්මකං කාව්‍යං'' රමණීය අරුත් උපදවන වාක්‍ය කාව්‍ය වේ. (විශ්වනාථ) ''කාව්‍යං විශිෂ්ට ශබ්දාර්ථං සාහිත්‍යසදලංකෘත්'' විශිෂ්ට වූ ශබ්දයෙන් හා අර්ථයෙන් යුක්ත අලංකාර වාක්‍ය කවිය නම් වේ. (කවිකන්ඨාභරණ) ''රමණීයාර්ථ ප්‍රතිපාදකඃ ශබ්දඃ කාව්‍යම්'' රමණීය අරුත් ප්‍රතිපාදනය කරන ශබ්දය කාව්‍ය වේ. (ජගත්නාථ.) ''කවීත්ව

බීජං ප්‍රතිභානං'' කවිය වූ කලි ප්‍රතිභාවේ මූලය වේ. (රුද්‍රට.) ''ශබ්දාර්ථෞ නිර්දෝෂෞ සගුණෞ ප්‍රායඃ සාලංකාරෞ කාව්‍යම්'' දොස් රහිත වූත්, ගුණ සහිත වූත් අලංකාර වලින් ශෝභා සම්පන්න වූ ශබ්දාර්ථ දෙදෙනා කවිය නම් (වාග්භට්ට.) ''සෞන්දර්යමලංකාරඃ'' කාව්‍ය පුරා පැතිරුණු සුන්දරත්වය අලංකාර නම්. (වාමන) ''තදතිශයහෙතවස්ත්වලංකාරඃ'' කාව්‍ය ශෝභාව ඇති කරනුයේ ගුණ බවත් කාව්‍ය ශෝභාවට අතිශය හේතු වූ ධර්මයෝ අලංකාර වෙයි. (වාමන.) ''න කාන්තමපි නිර්භූෂං විභාති වනිතානනම්'' ස්වභාවයෙන් සුන්දර වූ කාන්තාවගේ මුහුණ පවා අලංකාරයෙන් තොරව නො බබලයි. (භාමහ.) ''කවිය වූ කලී ජීවිතය පිළිබඳ මිනිසාගේ ප්‍රති ක්‍රියා සටහන් කරන උපකරණයක'' (ලුවී මැක්නීස්.) ''කවිය යනු අනුත්සාහකව ගලා එන ප්‍රබල හැඟීම් ය'' (විලියම් වර්ඩ්ස්වර්ත්) ''කවිය වනාහි හොඳම වචන හොඳම පිළිවෙලකට යෙදීමයි'' (එස්.ටී. කොල්රිජ්) ''කවිය යනු අනුස්මරණීය වාගාලාපයයි'' (ඩබ්ලිව්.එච්. ඕඩන්)

මෙම පෙරාපර දෙදිග නිර්වචයන්ගෙන් පැහැදිලි වන්නේ කවිය හෙවත් කාව්‍ය යනු කුමක්ද යන්න පිළිබඳවය. කාව්‍ය යනු සංකීර්ණ වූ සාහිත්‍යාංගයක් වශයෙන් මෙම නිර්වචන ආශ්‍රයෙන් පැහැදිලි වෙයි. කාව්‍ය තුළින් සිදු වන්නේ කවියාගේ භාව ප්‍රකාශන තුළින් චමත්කාරයක් හා අපූරු අත්දැකීම් සමුදායක් ඉදිරිපත් කිරීමකි. මෙයින් පෙනී යන්නේ කාව්‍යයේ ශෝභාකාරකය අලංකාර බවයි. ඊට සමාන අදහසක් පාලි අලංකාර ශාස්ත්‍රය පිළිබඳ කෘතියක් වූ සුබෝධාලංකාර සම්පාදනය කළ ශ්‍රී සංඝරක්ෂිත පාදයන් ඉදිරිපත් කරයි.

''අත්ථාලංකාරසහිතා - සගුණා බන්ධපද්ධතී,

යතො අච්චන්තකන්තාව - වුච්චන්තෙ තෙ තතො'ධුනා''[3]

ප්‍රසාදා දී ගුණයෙන් යුක්ත වූ කාව්‍ය බන්ධනය අලංකාර සහිත වූයේ අතිශයින් රමණීයත්වයට පත්වේ ද ඒ අලංකාර මෙතැන් සිට කියනු ලැබේ. යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් දර්ශනීය වන්නේ ඇගේ හෝ ඔහුගේ ශරීර ශෝභාව කැපී පෙනෙන ආකාරයට අදාළ වස්ත්‍රාභරණ ආදියෙන් නිසියාකරව සැරසීමෙනි.[3]

එහි එම ශරීරයේ රමණීයත්වය සිත් ඇදගන්නා සුළුවෙයි. එසේ කවිය, ශ්ලෝකය, ගාථාව හෝ ගද්‍ය අලංකාර මුසු වූ තරමට ශෝභාවමත් වෙයි.

"කිංසු නිදානං ගාථානං, කිංසු තාසං වියඤ්ජනං;
කිංසු සන්නිස්සිතා ගාථා, කිංසු ගාථානමාසයොති

"ඡන්දො නිදානං ගාථානං, අක්ඛරා තාසං වියඤ්ජනං,
නාමසන්නිස්සිතා ගාථා, කවි ගාථානමාසයොති."[4]

කවි සූත්‍ර පාඨයෙන් පැහැදිවන්නේ ගාථා නම් කවිත්වයයි. භාවපූර්ණ ප්‍රකාශනයයි. චමත්කාර ජනනය කරන්නා වූ වස්තු බීජයයි.

අලංකාර ගද්‍ය හා පද්‍ය යන දෙයංශයෙහි ම යොදයි. මූලික වශයෙන් පාලි කාව්‍ය ගද්‍ය හා පද්‍යා වශයෙන් කොටස් දෙකකට බෙදෙයි. ගද්‍ය නම් පද්‍යයෙන් තොර වූ වාක්‍ය කණ්ඩයයි. ගද්‍ය කාව්‍ය කොටස් හතරකින් යුක්ත වෙයි.

01. මුත්තක කාව්‍ය

02. වෘත්තගන්ධි කාව්‍ය

03. උක්කලිකප්‍රාය කාව්‍ය

04. චූර්ණක කාව්‍ය

"වෘත්ත බන්ධොජ්ඣිතං ගද්‍ය - මුක්තකං වෘත්තගන්ධිච
භවේ දුත්කලිකාප්‍රායං - චූර්ණකංච චතුර්විධං"[5]

පද්‍ය කාව්‍ය කොටස් පහකට බෙදෙයි. ගද්‍යයෙන් තොර වූ කාව්‍ය විශේෂය පද්‍ය නම් වෙයි. එම පද්‍ය ඡන්දසින් බන්ධනය කොට තිබේ.

01. මුත්තක කාව්‍ය

02. යුග්මක කාව්‍ය

03. සන්දානිතක කාව්‍ය

04. කලාපක කාව්‍ය

05. කුලක කාව්‍ය

"ආද්‍යං සමාසරහිතං - වෘත්තභාගයුතං පරම්
අන්‍යද්දීර්ඝ සමාසාඪ්‍යං - තුර්යංචාල්පසමාසකම්"[6]

කාව්‍ය ආකෘතිය තුළ දක්නට ලැබෙන සුවිශේෂිත කරුණු කීපයකි. එම කරුණු නිසා කාව්‍ය ගුණ නොනැසී පවතී. ගුණාත්මක වශයෙන් කාව්‍ය අගයෙන් යුක්ත වෙයි. උසස් කාව්‍ය නිර්මාණයක් සඳහා කාව්‍ය ආකෘතිය පිළිබඳ අවධාරණය කළ යුතුය.

- භාෂාව
- සංකල්ප රූප
- පරිකල්පන ශක්තිය
- ශබ්ද ධ්වනි
- හැඟීම් දැනවීම
- සිතුවිලි
- ආකෘතිය

යන කරුණු මූලික වශයෙන් කාව්‍ය විචාරයේ දී ද වැදගත් වෙයි. මෙම කරුණු මත පදනම් වී කාව්‍යකරණය හා කාව්‍ය නිෂ්පත්තිය සිදු කරනු ලබයි. හුදෙක් කාව්‍ය යන්න විමසා බැලීමේ දී මෙම කරුණු කෙරෙහි අවධානය දිය යුතුය.

### භාෂාව

කවියාගේ කාව්‍යකරණයට මාධ්‍යවන්නේ භාෂාවයි. කාව්‍යකරණයට විශේෂයෙන් සැකසුණු භාෂාවක් දක්නට නැත. ඒ සඳහා ඇත්තේ සාමාන්‍ය ව්‍යවහාරිත භාෂාවයි. කවියා එකී භාෂා ඉතා සිත්ගන්නා ආකාරයට යොදයි. ස්වකීය අත්දැකීම් සමුදාය සහෘදයා කරා සම්ප්‍රේක්ෂණය කරන්නේ භාෂාව තුළිනි. කාව්‍යකරණයේ දී භාෂාව අර්ථ දෙකක් වාච්‍ය කරයි. මතුපිට අර්ථය හෙවත් වාච්‍යාර්ථය හා ගැඹවුණු අර්ථය හෙවත් ව්‍යංගාර්ථයයි. ශෝභාසම්පන්න භාෂාව වශයෙන් ආනන්දවර්ධනයන්ගේ පැසසුමට ලක්වන්නේ ව්‍යංගාර්ථයයි. "කාව්‍යස්‍යාත්මා ධ්වනිඃ"[7] යනුවෙන් ධ්වන්‍යාලෝක නම් කෘතියේ දී ප්‍රකාශ කරන්නේ එකී අදහසයි. කාව්‍යයක පවත්නා භාෂාව පෙරදිග විචාරයකයන් හඳුන්වන්නේ 'රීති' වශයෙනි.

## සංකල්ප රූප

කාව්‍ය රසවිඳින්නාගේ ඇස කණ නාසය දිව ශරීරය යන පඤ්චේන්ද්‍රියන් මාර්ගයෙන් සිතේ ඇති වෙන්නා වූ භාව ප්‍රබෝධය ඇති චිත්‍රය සංකල්ප රූප නම් වෙයි. සංකල්ප රූප තුළින් සිදු වන්නේ රසවිඳින්නාගේ සිතේ භාව ප්‍රකාශ වශයෙන් උත්කර්ෂවත් ආකාරයෙන් මුල් බැස ගැනීමයි. එයින් සාමාන්‍ය ලෝකයෙන් කාව්‍ය ලෝකය ප්‍රවේශය සිදු වෙයි. සංකල්ප රූප භාවිත කරන කවියා විසින් සහෘදයා රමණීයත්වයට පත්කරයි. සංකල්ප රූපයෙන් තොරව කාව්‍ය නිර්මාණය කළ නොහැකි වෙයි. කවියා සංකල්ප රූප නිර්මාණය කිරීම සඳහා අලංකාර යොදා ගනී. පෙර දිග කාව්‍ය ශාස්ත්‍රයෙහි දී භාමහගේ කාව්‍යාලංකාරය, රුද්‍රටගේ කාව්‍යාලංකාර සංග්‍රහය, දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශය වැදගත් වේ. එ මෙන් ම අපර දිග කාව්‍ය ශාස්ත්‍රයෙහි හර්බඩ් රීඩ්, මිඩ්ල්මන් මරී වැනි විචාරකයන් ද කාව්‍යාත්මක රමණීයත්වය ඇති වන්නේ අලංකාර වලින් බව පෙන්වා දෙයි. ඒ සඳහා විශේෂයෙන් භාවිත වන අලංකාර වර්ග දෙකක් දක්නට ලැබේ. එනම්, ශබ්දාලංකාර හා අර්ථාලංකාරයි. මෙකී අලංකාර භාවිත කොට කිසියම් කාව්‍ය රචනයක් සිදු කළ විට එහි රමණීයත්වය වැඩි වේ. සංකල්ප රූප භාවිතයේ දී අලංකාරවලට අමතරව සංකේත භාවිතයක් කවියා සිදු කරනු ලබයි.

## පරිකල්පන ශක්තිය

කාව්‍ය විචාර මූල ධර්ම අතර පරිකල්පන ශක්තිය ඉතා වැදගත් මූල ධර්මයකි. 'කල්පන' යනු සිතීමයි. චින්තය මෙහෙයවීමයි. පරිකල්පනය යනුවෙන් අදහස් කරන්නේ සුවිශේෂ වශයෙන් සිතීමයි. හාත්පසින් සිතීමයි. එනම් කාව්‍යයක් යනු මනාකොට සිතා නිර්මාණය කරන ලද්දකි. කවියා සිය අත්දැකීම පෙර නොවූ විරූ දෙයක් වශයෙන් සමාන්‍ය ලෝකව්‍යවහාරයේ පවත්නා දෑ කාව්‍යලෝකයට ගලපා ගන්නේ පරිකල්පන ශක්තිය තුළිනි. මෙම පරිකල්පන ශක්තිය පෙරදිග කාව්‍ය විචාරයේ දී ප්‍රතිභාව වශයෙන් හඳුන්වයි. ''අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රතිභා'' යනුවෙන් විස්තර කරයි. යම් වස්තුවක් අපූර්ව ආකාරයට නිර්මාණ කළ හැක්කේ ප්‍රතිභාව තුළිනි.

### ශබ්ද ධ්වනිය

කාව්‍ය විචාරයේ දී තවත් වැදගත් වන කාව්‍ය විචාර මූල ධර්මයක් වන්නේ ශබ්ද ධ්වනි. ශබ්ද ධ්වනි කාව්‍යකරණයේ ආකාර දෙකක් ඔස්සේ භාවිත වී ඇති ආකාරය පෙනෙයි. අර්ථ ධ්වනි හා ශබ්ද ධ්වනි වශයෙනි. අර්ථ ධ්වනියත් ශබ්ද ධ්වනියත් එකතු වීම කාව්‍ය නම් වෙයි. ''ශබ්දාර්ථෞ සහිතෞ කාව්‍යම්'' යනුවෙන් දක්වන්නේ ඒ නිසාය. කිසියම් කාව්‍යයක රස ජනනය වන්නේ ශබ්ද රසය හා අර්ථ රසය වශයෙනි. කාව්‍ය විචාරයේ දී විමසිය යුත්තේ මෙම පැතිකඩ දෙක ම කාව්‍යයෙහි පවතී ද යන්නයි. ශබ්දාර්ථයන් හීන වූ විට කාව්‍ය රස හීනත්වයට පත්වෙයි.

### හැඟීම් දැනවීම

කවියා විසින් සිදු කරනු ලබන්නේ සහෘදයාගේ භාවයන් ආමන්ත්‍රණය කිරීමයි. එනම් සහෘදයාගේ මනසට සිතුවිලි ඇති කරලීමයි. එකී භාවයන් පහත් ආවේගයන් නොවේ. උසස් සිතුවිල්ලක් හෝ සිතුවිලි සමුදායක් ඇති කිරීම් හැඟීම් දැනවීම වශයෙන් සඳහන් කළ හැකිය. කාව්‍යයක එකී මූල ධර්මයන් පවතීදැයි විමසා බැලීම කව්‍ය විචාරයේ දී සිදු කරනු ලබයි. උසස් සිතුවිලි සමුදායක් සිතේ ඇති වී උසස් කව්‍යයක ස්වභාවය වෙයි. එකී අදහස බටහිර කව්‍ය විචාරක පී. ග්‍රේ ද පිළිගනී.

### චින්තනය

කාව්‍යා විචාරයේ දී කාව්‍යයෙහි පවත්නා චින්තය, එහි දැක්ම පිළිබඳ සොයා බැලිය යුතුයි. කාව්‍යයක් රසවිඳීමෙන් උත්කෘෂ්ට සිතුවිල්ලක් ඇති විය යුතුය. එකී දැක්ම හෙවත් දර්ශනය උසස් තලයේ පවත්නා දැ වීම මෙහි දී අතිශය වැදගත් වෙයි. ඕනෑම නිර්මාණයක් තුළින් උසස් දැක්මක් ඇති නොවේ. එම නිසා කාව්‍ය විචාරයේ වැදගත් වන්නේ කාව්‍ය රසවින්දනය තුළි රස විඳින්නාගේ සිතේ උසස් චිනතනයක් ඇති වන්නේදැයි විමසා බැලීමයි. නිර්මාණාත්මක කාව්‍ය තුළින් රස විඳින්නා තුළ ඇති වන්නේ උසස් සිතුවිලි සමුදායකි.

ආකෘතිය

කාව්‍ය රචකයා ස්වකීය කාව්‍ය නිර්මාණය සහෘදයා වෙත රැගෙ යන්නා වූ හැඩය, ස්වරූපය, මෙවලම, ආකෘතිය නම් වේ. එකී ආකෘතිය කවි, ගාථා, ශ්ලෝක ආදී වශයෙන් කිසියම් කාව්‍ය නිර්මාණයක් විය හැකිය. විශේෂයෙන් කවියාගේ වස්තුවට හෝ අන්තර්ගතයට ගැලපෙන ආකාරයෙන් ආකෘතිය සකසා ගත යුතුයි. ගාථා ආදියේ දී ආකෘතිය වන්නේ වුත්ත, වෘත්ත හෙවත් විරිතයි. මෙම වෘත්ත පිළිබඳ නිවැරදිතාව පරීක්‍ෂා කිරීම කාව්‍ය විචාරයේ සිදු කරනු ලබයි.

කිසියම් කාව්‍ය වස්තුවක් සඳහා භාවිත කාව්‍යාලංකාර තුළින් කාව්‍යයේ උද්දීපනය වඩාත් තීව්‍ර වෙයි. කාව්‍යයට ආලෝකය ලැබෙන්නේ කාව්‍යාලංකාර මුසු වූ පසුවය. එයින් කාව්‍ය ශෝභාවමත් වෙයි. කාව්‍ය ප්‍රස්තුතයේ ස්වභාවය අනුව අලංකාර යොදනු ලබයි. එකී කාව්‍යාලංකාර ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදෙයි. 01. අර්ථාලංකාර 02. ශබ්දාලංකාර වශයෙනි.[8] මෙහි දී ශබ්දාලංකාර අතුරින් ප්‍රධාන අලංකාර කීපයපක් පිළිබඳ විමසීම සිදු කරනු ලබයි.

උපමාලංකාරය

කාව්‍යාලංකාර අතර උපමාලංකාරය ඉතා ප්‍රසිද්ධ වූ කාව්‍යාලංකාර විශේෂයකි. උපමා හා උපමාලංකාර වශයෙන් දෙයාකාර වෙයි. උපමා හුදෙක් කිසියම් දෑ උපමාකර දැක්වීමට යොදන්නා වූ භාෂාත්මක ප්‍රයෝගයකි. "ඡයාව අනපායිනී" හා "චක්කව වහතො පදං" යන්න යෙදුම් උපමාය. කිසියම් අදහසක් දැනවීමට භාවිත භාෂාත්මක ප්‍රයෝග විශේෂයකි. උපමා අලංකාරයක් බවට පත්වීමට අංග හතරක් සම්පූර්ණ විය යුතු බව සුබෝධාලංකාරයේ ඉගැන්වීම වෙයි.

"උපමානොපමෙය්‍යානං සධම්මත්ථං විභාවිහී,

ඉමෙහි උපමා භෙදා කෙචි නීයන්ති සම්පති"[9]

උපමාලංකාරය සඳහා ප්‍රධාන වශයෙන් කරුණු හතරක් පැවතිය යුතුයි. එයින් නිර්මාණය වන්නේ උපමාලංකාරයයි. ඒ සඳහා,

- උපමේය
- උපමාව
- වාචකය
- සාධාරණ ධර්මය

යන කොටස් පැවතිය යුතුය. උපමේ නම් කාව්‍ය ප්‍රස්තුත වස්තුවයි. කවියා විසින් වර්ණනා කරනු ලබන්නා වූ කාව්‍ය වස්තුව උපමේය නම් වෙයි. උපමේය කවියා සතුය. උපමාව වන්නේ උපමේය විස්තර කිරීම සඳහා බැහැරින් ගන්නා වූ වස්තුවයි. උපමේය උත්කර්ෂයෙන් අනූන බව දක්වන්නේ උපමාවට සම්බන්ධ කරමින්ය. උපමාව ප්‍රසිද්ධ වස්තුවක් වෙයි. එහි ලෝක ප්‍රසිද්ධ හේතු නිසා උපමේයයෙහි අගය වැඩි වෙයි. වාචකය නම් උපමේය හා උපමාව සම්බන්ධ කරන පදයයි. පාලි භාෂාවේ බෙහෙවින් උපමා සඳහා යෙදෙන්නේ 'විය' යන නිපාත පදයයි. එසේ ම යථා, තථා, සදිසං, සමානං, ඔපම්මං ආදි පද යෙදෙන අවස්ථා ඇත. සාධාරණ ධර්ම නම් උපමා උපමේය දෙදෙනාගේ පවත්නා සාධාරණ බවයි. ''ඇගේ දෙතොල නා දළු සේ සමානයි'' යනුවෙන් උපමා කළ කල්හි නා දළු හා තොල කිසියම් ආකාරයක වර්ණයෙන් හා හැඩයෙන් කිසියම් ආකාරයක සමාන බවක් පැවතිය යුතුය. උපමේයෙහි ඇති ගුණය උපමාවෙහි පැවතීමයි. උපමාවෙහි ස්වභාවය පාදක කොට ගෙන උපමාලංකාරය කොටස්වලට බෙදෙයි. උදාහණ:-

''සිංගෙසු රදසිනිකරා සුරමන්දිරානං
සිංගෙසු රංසිමබභාසකරා'ව නිච්චං,
ආදිච්ච රංසි සිව පංකජකානනානි
ලොකානනම්බුජවනානි විකාසයන්ති''[10]

උපමාලංකාරයේ පරිභාවිත උපමා පදය යොදන ආකාරය අනුව කොටස් කීපයකට බෙදා වෙන් කරනු ලබයි. සුබෝධාලංකාරය ධර්මෝපමා, විපරීතෝපමා, අබ්භුතෝපමා, නින්දෝපමා, ප්‍රතිෂේධෝපමා, අභුතෝපමා, සරූපෝපමා, පරිකල්පෝපමා, සංසයෝපමා, ප්‍රතිවස්තූපමා, හීනෝපමා, අපුච්ඡත්ථෝපමා, ඛණ්ඩිතෝපමා ආදී වශයෙන් කොටස්වලට බෙදෙයි. උපමාලංකාරයෙහි ප්‍රසිද්ධ වූ උපමා දෙකක් වන අබ්භුතෝපමා හා ප්‍රතිවස්තූපමා අලංකාර පිළිබඳ විමසා බැලීම වැදගත් වෙයි.[8]

අබ්භුතෝපමාලංකාරය

ලෝක සීමාව තුළ දක්නට නැති එහෙත් මෙසේ වූයේ නම් හොඳයැයි කරනු ලබන උපමාව අබ්භුතෝපමාලංකාරය වශයෙන් හඳුන්වයි. අවිද්‍යමාන වුවත් විද්‍යමානත්වයේ කල්පිතය අබ්භුතෝපමාවයි. එයින් කියවෙන්නේ පුදුමය හෙවත් ආශ්චර්යයි.[11]

උදාහණ:-

''යදිප්පවාලම්බුධි ඛීර සාගරා

සමං චරෙයුං භුවනෙ සමන්තතො,

තතොනු කුබ්බන්ති දිසාසු විත්ථටා

යසප්පබන්ධා තප තෙජ වෙල්ලිතා''[12]

(ඉදින් රතු පැහැති පබළු සයුරත් සුදු පැහැති කිරි සයුරත් ලෝකයෙහි එකවිට පැතිරුණ හොත් යසස් ගුණය හා තපස් ගුණය මුසු වූ නාහිමියන්ගේ අනූපමේය ගුණයට උදාහරණ වෙයි)

ප්‍රතිවස්තුපමාලංකාරය

යම්කිසි කාව්‍ය වස්තුවක් ප්‍රථමයෙන් ගෙන හැර දක්වා එකී වස්තුව සමර්ථන කරනු පිණිස කිසියම් වස්තුවක් ඉදිරිපත් කිරීම ප්‍රතිවස්තූපමාලංකාරය වෙයි. කවියා විසින් ඉදිරිපත් කරන ප්‍රතිවස්තුවෙන් කාව්‍යයට ආලෝකය වෙයි.

''කිඤ්චි වත්ථුං පදස්සෙත්වා සධම්මස්සා'භිධානතො,

සාම්‍යපතීති සබ්භාවා පටිවත්ථූපමා යථා''[13]

උදාහරණ:-

''ජාතෙසු ජායමානෙසු නෙ' කොපි ජිනසදිසො,

දුතියො නනු නත්ථෙව පාරිජාතස්ස පාදපො''[14]

(උපන්නා වූ සත්ත්වයන් අතර බුදුරදුන්ට සමාන කෙනෙක් නැත. දෙවියන්ගේ පරසතු වෘක්ෂයට දෙවැනි වූ වෘක්ෂයක් නොවන්නා මෙනි)

### රූපකාලංකාරය

උපමාලංකාරයෙහි සංවර්ධනීය අවස්ථාවක් වශයෙන් රූපකාලංකාරය හැඳින්විය හැකිය. රූපකාලංකාරය තුළ උපමාලංකාරය පූර්ණයෙහිලා වූ අංග සතරින් වාචකය අවිද්‍යමානව පවතී. එනම් වාචක පදය ලොප් කොට ඇත. එයින් ගම්‍ය වන්නේ උපමේය ම උපමාව වශයෙන් ගැනීමයි. සිංහල භාෂාවේ භාවිත මෙන්, සේ, එව්, වැනි උපමාජෝතක පද රූපකාලංකාරයෙහි දක්නට නැත. පාලි සංස්කෘත භාෂාවේද යෙදෙන වචක පදය දක්නට නොලැබෙන්නේ රූපකාලංකාරයෙහිය.

"උපමානොපමෙය්‍යාන මභෙදස්ස නිරූපනා,

උපමෙවතිරොභූත භෙදා රූපකමුච්චතො"[15]

රූපකාලංකාරයෙහි භෙද පවතී. කොටස් වශයෙන් රූපකයෙහි යෙදීම අනුව විවිධ වෙයි.

### දීපකාලංකාරය

ගාථාවක එක පදයක් තුළින් මුළු ගාථාව ම ආලෝකමත් වීම දීපකාලංකාරයේ ස්වභාවය වෙයි. එකී පදය දීපක පදය නම් වෙයි. පදයක් තුළින් ගාථාව උත්කර්ෂවත්වීම දීපකාලංකාරයෙහි භාවිතය වෙයි.

"එකත්ථ වත්තමානම්පි සබ්බවාක්‍යොපකාරකං,

දීපකං නාම තඤ්චාදී මජ්ඣත්තවිසයං තිධා"[16]

දීපක පදය වනාහි ජාති, ක්‍රියා, ගුණ හා ද්‍රව්‍ය යන කුමන හෝ පදයක් යෙදිය හැකිය. එසේ ම ගාථාවේ මුල මැද හා අග යන ත්‍රිවිධ ස්ථානයේ ද යෙදීමට අවකාශ තිබේ. ඒ අනුව ආදි ජාති දීපකාලංකාරය, මධ්‍ය ජාති දීපකාලංකාරය, අන්ත ජාති දීපකාලංකාරය, ඒ ජාති පදයේ යෙදීම වෙනුවට ක්‍රියා පදයක් යෙදුවේ නම් ආදි ක්‍රියා දීපකාලංකාරය, මධ්‍ය ක්‍රියා දීපකාලංකාරය, අන්ත ක්‍රියා දීපකාලංකාරය, ගුණ පදයක් යෙදුවේ නම් ආදි ගුණ දීපකාලංකාරය, මධ්‍ය ගුණ දීපකාලංකාරය, අන්ත ගුණ දීපකාලංකාරය, ද්‍රව්‍ය පදයක් යෙදුවේ නම් ආදි ද්‍රව්‍ය දීපකාලංකාරය, මධ්‍ය ද්‍රව්‍ය දීපකාලංකාරය, අන්ත ද්‍රව්‍ය දීපකාලංකාරය

වශයෙන් කොටස් වෙයි. උදාහරණ:-

"අකාසි සම්බුද්ධො වෙනෙය්‍ය බනුධූනමම්තොදයං,

සබ්බ පාපෙහි ච සමං නෙක තිත්ථියමද්දනං"[17]

(බුදුරදුන් හික්මවිය යුතු ජනයාට අභිවෘද්ධිය කළහ. නොයෙක් තීර්ථකයන් රජසි සහිතව ම මර්ධනය කළහ)

### අර්ථාන්තරන්‍යාසාලංකාරය

කාව්‍ය වස්තුව ඉදිරිපත් කොට එකී වස්තුව වඩාත් පැහැදිලි කරනු සඳහා බැහැරින් අර්ථාන්තරයක් පැමිණවීම අර්ථාන්තරන්‍යාසාලංකාරය නම් වෙයි. කාව්‍ය වස්තුට සංයුක්ත කළ අර්ථාන්තරය කාව්‍ය වස්තුවෙන් වියුක්ත කළ කල පවා අර්ථාන්විත වීම අර්ථාන්තරන්‍යාසාලංකාරයෙහි ස්වභාවය වෙයි.

"ඤෙය්‍යො සො'ත්ථන්තරන්‍යාසො යො'ඤ්ඤවාක්‍යත්ථසාධනො,

සබ්බව්‍යාපීවිසෙසට්ඨා හිවිට්ඨා'ස්ස භෙදතො"[18]

අර්ථාන්තරන්‍යාසාලංකාරයෙහි කොටස් බෙදීම් දක්නට ලැබේ. ප්‍රස්තුත කරුණු දැනගැනීමට අවශ්‍ය වූ විට අප්‍රස්තුතයක් දක්වා ප්‍රස්තුතය පැහැදිලි කිරීම මෙහි දී සිදු වෙයි. වෙනත් අන්තරයකින් පැහැදිලි කිරිම නිසා අර්ථාන්තරන්‍යාස යනුවෙන් හඳුන්වයි.

උදාහරණ:-

"සත්ථා දෙවමනුස්සානං වසී සො'පි මුනිස්සරො,

ගතො'ච නිබ්බුතිං සබ්බෙ සංඛාරා න හි සස්සතා"[19]

### විභාවනාලංකාරය

විභාවනා අලංකාරය ශබ්දාලංකාරයන්ට අයත්වන්නකි. ලොව පවත්නා කිසියම් වස්තුවක් පිළිබඳ විචිත්‍ර වූ වර්ණනය ප්‍රකාශ කොට කවියාගේ කාව්‍ය වස්තුව අන්‍ය වස්තූන්ටත් වඩා ගුණයෙන් උසස් බව දැක්වීම විභාවනා අංකාරයේ ස්වභාවය වෙයි. ඒ බව සුබෝධාලංකාර කර්තෘවරයා උගන්වන්නේ මෙසේය.

''පසිද්ධං කාරණං යත්ථ - නිවත්තෙත්වා'ඤ්ඤකාරණං,

සභාවිකත්තමථවා - විභාව්‍යං සා විභාවනා''[20]

යම් තැනක ප්‍රසිද්ධකාරණය ප්‍රතික්ෂේප කොට අප්‍රසිද්ධ කාරණයකින් හෝ ස්වභාවිකත්වයෙන් කියන්නේ වේද එය විභාවනාලංකාරය නම් වෙයි. කිසියම් ගාථා බන්ධනයක් කරන විට ප්‍රසිද්ධ අර්ථය පසෙක දමා සැගවුණු අර්ථ ඇති වෙනත් කරුණුනක් කිවන්නේ ද එසේ ස්වභාවිකත්වය කියන්නේවේද එය විභාවනා නම් වෙයි. උදාහරණ:-

''ලසති තුහිනරංසිපුණ්ණරංසිනිසායං
ලසති දිවසභාගෙභානුමානන්තභානූ,

ලසති කමලසණ්ඩං පත්තගිම්හාන්කාලෙ
ජයති යතිරො'යං සබ්බදාමෙරුධීරො''[21]

උත්පේක්ෂාලංකාරය

උත්පේක්ෂා අලංකාරය ශබ්දාලංකාරයන්ට අයත්වන්නකි. ලොව පවත්නා කිසියම් සචේතන හෝ අචේතන කාව්‍ය වස්තුවක් පිළිබඳ ගාථාකරණයෙහි යෙදෙන කවියා සිය සම්භාවනාවට පත්කොට එය වෙනස් වූ ස්වරූපයකින් ඉදිරිපත් කිරීම උත්පේක්ෂාලංකාරයෙහි ස්වභාවය වෙයි. සාහිත්‍යදර්පණයේ දී ''භවෙත් සම්භාවනොත්පේක්ෂා ප්‍රස්තුතස්‍යපරාත්මනං'' යනුවෙන් උගත්වන්නේ ද එයයි. සුබෝධාලංකාරය උත්පේක්ෂාව පරිකප්පනා වශයෙන් හඳුන්වයි.

''වත්ථුනො'ඤ්ඤප්පකාරෙන - ඨිතා වුත්ති තදඤ්ඤථා,

පරිකප්පීයතෙ - සා හොති පරිකප්පනා''[22]

සවිඤ්ඤාණක හෝ අවිඤ්ඤාණක වස්තුවේ පැවැත්ම කීම. එය වෙනස් ආකාරයකට ප්‍රකාශ කිරීම උත්පේක්ෂාලංකාරයෙහි ස්වභාවය වෙයි.

''සදාමහොඝාය මහාපගාය - පානීයපානාය සමොසටානං,

සමුච්චයො සාරදවාරිදානං - නූනං ගතො ථාවරථූපරූපං''[23]

(සැම කල්හි මහත් වූ ජලවේගයෙන් යුක්ත වූ මහවැලි ගංගාවෙහි ජලය බොනු පිණිස අවතීර්ණ වූ සරත් කාලයෙහි වලාකුළු සමූහය ඒකාන්තයෙන් ස්ථාවර වූ ස්තූපයක් ආකාරය පැමිණියේ වෙයි)

ආන්තික සටහන් :


1. ඉති සංසරක්ෂිත යතින්ද විරචිතෙ සුබොධාලංකාරෙ, සුබොධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. 83 පිටුව.

2. පේමරතන හිමි වැලිවිටියේ, දේවානන්ද හිමි හල්ගස්තොට කාව්‍යාදර්ශය (ප්‍රථම භාගය) යූ. පී. ඒකානායක සහ සමාගම, 1951, 53 පිටුව.

3. සුබොධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. 1 ගාථාව, 66 පිටුව.

4. සංයුත්ත නිකාය I භාගය, කවි සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 70 පිටුව.

5. විද්‍යාසාගර, ජිබානන්ද, සාහිත්‍යදර්පණය, චතුර්ථ සංස්කරණය, කල්කටා, 1965, 10 පරිච්ඡේදය, 628, ශ්ලෝකය, පි. 47

6. එම, 628, ශ්ලෝකය, පි. 47

7. සේනානායක ජී. එස්. බී. ධ්වන්‍යාලෝක විවරණය, සීස/ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1969, 522 පිටුව.

8. සුබොධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. පිට 66.

9. එම, පිට 67. පේමරතන හිමි වැලිවිටියෙ, දේවානන්ද හිමි හල්ගස්තොට කාව්‍යාදර්ශය (ප්‍රථඹ භාගය) යූ. පී. ඒකානායක සහ සමාගම, 1951, 57 පිටුව.

10. විමලවංස හිමි, බද්දේගම, ජනචරිතය, සීස/ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, ද්විතීය මුද්‍රණය 1969, 137 ගාථාව, 14 පිටුව

11. සුබෝධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. 26 ගාථාව, 68 පිටුව.

12. ගමගේ අරුණ, කේ. මහානාගකුල සන්දෙසය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, කොළඹ, 2012, 47 ගාථාව, 8 පිටුව. සිරි රාහුල හිමි, අත්තුඩාවේ, මනාවුලුසංදේසය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2000, 47 ගාථාව, 22 පිටුව.

13. සුබොධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. ගාථා 37, පිට 69.

14. එම, 38 ගාථාව, පිට 69.

15. එම, 49 ගාථාව, පිට 70.

16. එම, 65 ගාථාව, පිට 71.

17. එම, 66 ගාථාව, පිට 71.

18. එම, 76 ගාථාව, පිට 72.

19. එම, 78 ගාථාව, පිට 72.

20. එම, 2009. පිට 83.

21. ගමගේ අරුණ, කේ. මහානාගකුල සන්දෙසය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම, කොළඹ, 2012, 54 ගාථාව, 9 පිටුව. සිරි රාහුල හිමි, අත්තුඩාවේ, මනාවුලුසංදේසය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2000, 54 ගාථාව, 23 පිටුව.

22. සුබොධාලංකාරය, (සංස්:) ගුණානන්ද හිමි ගන්තලාවේ, සමයවර්ධන පොත්හල, කොළඹ, 2009. පිට 83.

23. ධම්මරතන හිමි, උතුරාවල, හත්ථවනගල්ලවිහාරවංසය, (සංස්.) සමයවර්ධන ප්‍රකාශන, කොළඹ, 1982, 7 ගාථාව, 2 පිටුව